**"ඩිජිටල් බෙදීම් වසා දමන්න: කොවිඩ්-19 සඳහා ඩිජිටල් ප්‍රතිචාරය"**

**අතථ්‍ය අමාත්‍ය සමුළුව**

**2020 ජූලි 01වැනි දින**

**ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා හා නිපුණතා සංවර්ධන, රැකියා හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු. දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රකාශය**

ආයුබෝවන්!

එස්තෝනියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. උර්මාස් රෙයින්සලු මැතිතුමනි,

සිංගප්පූරුවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු. ආචාර්ය විවියන් බාලක්‍රිෂ්ණන් මැතිතුමනි,

ගරු. අමාත්‍යවරුනි, දයාබර මිතුරනි,

- අද දින මෙම කාලෝචිත රැස්වීම කැඳවීම සඳහා එස්තෝනියාවේ සහ සිංගප්පූරුවේ විදේශ අමාත්‍යවරුන් ගත් ඒකාබද්ධ පියවර ගැන මම ස්තූතිවන්ත වෙමි. "කොවිඩ්-19 සඳහා ඩිජිටල් ප්‍රතිචාරය පිළිබඳ ගෝලීය ප්‍රකාශය" ශ්‍රී ලංකාව අනුමත කරයි.

- කොවිඩ්-19 යනු අපගේ ජාතික මෙන්ම, ගෝලීය පද්ධතිවල ද ශක්තීන් සහ දුර්වලතා අනාවරණය කර ගැනීමේ දී අප සැම සඳහා වූ පරීක්ෂණයකි. කොවිඩ්-19 පැතිරීම පාලනය කර ගැනීමේ දී සමහර ජාතීන් සාර්ථක වී ඇති අතර අනෙක් රටවල් එය පාලනය කිරීමේදී බොහෝ අභියෝග සමඟ පොරබදමින් සිටිති.

- කොවිඩ්-19 වසංගතය ප්‍රජාව තුළ සම්ප්‍රේෂණය වීම ශ්‍රී ලංකාව විසින් සාර්ථකව පාලනය කර ඇති බව මම විශාල තෘප්තියකින් යුතුව දන්වමි. මෙරට තුළ මිලියනයකට රෝගීන් 90 ක් තරම් අඩු සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර, මියගිය සංඛ්‍යාව, වාර්තා වී ඇති ආසාදිතයන් සංඛ්‍යාවෙන් 0.54% ක් පමණි.

- නව ආසාදිතයන් පිළිබඳව වාර්තා වන්නේ විදේශයන්ගෙන් ආපසු පැමිණි අය අතර පමණක් වන අතර, ඔවුන් අනිවාර්ය නිරෝධායන කාලයකට භාජනය විය යුතු වේ. නැවත ආපසු පැමිණෙන සියලු දෙනාම, ආසාදිත පුද්ගලයින් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා හුදකලා කිරීම පිණිස ගුවන් තොටුපලේදී PCR පරීක්ෂාවට භාජනය වේ.

- රෝගය පාලනය කිරීම සහ වසංගත ආශ්‍රිත ගැටලු රාශියක් විසඳීම යන දෙකෙහි දීම ශ්‍රී ලංකාවේ සාර්ථකත්වය අර්ධ වශයෙන් සක්‍රීය වූයේ, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ දූරදර්ශී දේශපාලන නායකත්වයෙහි මඟ පෙන්වීම අනුව අපගේ සමස්ත රාජ්‍ය ප්‍රවේශය තුළ දී තාක්ෂණය ඵලදායී ලෙස භාවිතා කිරීමෙනි.

ශ්‍රී ලංකාව මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කිහිපයක් කෙටියෙන් දක්වමි:

- තාක්ෂණික මෙවලම් භාවිත කරමින්, කොවිඩ්-19 රෝගීන් සමඟ සම්බන්ධතා පැවැත්වූ වෙනත් අය සොයා ගැනීම, රෝග පොකුරු හඳුනා ගැනීම සහ පැය 24 ක් තුළ මෙම රෝගීන්ට නිරාවරණය වූ බවට සැක සහිත හෝ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් හුදකලා කිරීම මගින් ප්‍රජාව තුළ මෙම රෝගය පැතිරීම කාර්යක්ෂමව පාලනය කිරීමට හැකි විය.

- යාවත්කාලීන, කොවිඩ් ආශ්‍රිත තොරතුරු නිල මූලාශ්‍රවලින් පුරවැසියන්ට බෙදා හැරීම සඳහා, **MyHealth Sri Lanka** යෙදුම සහ **one-stop COVID site**, භාවිත කරන ලදී.

- නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා වන ඉල්ලීම් ද ඇතුළුව, විදේශීය ශ්‍රී ලාංකිකයන්ගේ ගැටලු පිළිබඳව කටයුතු කිරීම සඳහා විදේශ සබඳතා අමාත්‍යාංශය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) එක්ව "ශ්‍රී ලංකාව අමතන්න මාර්ගගත ද්වාරයක්" පිහිටුවන ලදී. නුදුරු අනාගතයේදී විද්‍යුත් සේවා සැපයීම සඳහා මෙම වේදිකාව යොදා ගත හැකිය.

- 'ගෙදර සිට වැඩ කිරීම' පිළිබඳ සංකල්පය කාර්යක්ෂම කිරීම සඳහා, meet.gov.lk නමින් විශේෂිත වේදිකාවක් හඳුන්වා දෙන ලද අතර, මෙම වේදිකාව සහ වෙනත් ජනප්‍රිය මාර්ගගත රැස්වීම් වේදිකා භාවිතා කිරීම සඳහා නොමිලේ ප්‍රවේශය හෝ සහන දත්ත ගාස්තු ලබා දීමට සියලුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් එකඟ විය.

- රාජ්‍ය අංශය සඳහා ඩිජිටල් අත්සන් භාවිතා කිරීම පිණිස නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

- සයිබර් අවකාශය වැඩි වශයෙන් භාවිතා කරන මෙම කාල පරිච්ඡේදය තුළ දී ජාතික සයිබර් ආරක්ෂණ ඒජන්සිය වන ශ්‍රී ලංකා සීඊආර්ටී (Sri Lanka CERT) විසින් සයිබර් ආරක්ෂාව හා සම්බන්ධ අභියෝගයන්ට මුහුණ දීම සඳහා විධිමත් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

- සියලුම විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ සහාය ඇතිව, රජය පාසල් ළමුන් සඳහා පිරිවැය රහිත නිල විද්‍යුත් ඉගෙනුම් ද්වාරයක් හඳුන්වා දුන්නේය.

- 'oDoc' ඔන්ලයින් මෙවලම මගින් රෝගීන්ට වීඩියෝ, ශ්‍රව්‍ය හා චැට් උපදේශන සඳහා නොමිලේ වෛද්‍යවරුන් සමඟ සම්බන්ධ වීමටත්, බෙහෙත් වට්ටෝරු ලබා ගැනීමටත්, ඖෂධ ලබා ගැනීමටත් ඉඩ ලබා දී තිබේ.

- කොටස් වෙළඳපොල කඩදාසි පදනමක සිට ඉලෙක්ට්‍රොනික පාදක පරිසරයකට මාරුවීමට හැකිවන පරිදි සංශෝධන සිදු කරන ලදී.

- වසර 126 කට පසු ප්‍රථම වතාවට කොළඹ තේ වෙන්දේසිය මාර්ගගතව පැවැත්විණි.

මෙම අර්බුදකාරී කාල පරිච්ඡේදය තුළ දී ඉමහත් දායකත්වයක් ලබා දුන් අපගේ පෞද්ගලික අංශයේ හවුල්කරුවන්ට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. රටේ

අනාගත ඩිජිටල් ඉල්ලීම් සපුරාලීමේදී මෙම හවුල්කාරිත්වය අඛණ්ඩව පවතිනු ඇතැයි මම අපේක්ෂා කරමි.

නෝනාවරුනි මහත්වරුනි,
දයාබර මිතුරනි,

- පශ්චාත් කොවිඩ්-19 ලෝකය සෑම අංශයකම පාහේ ඩිජිටල් විසඳුම් මත දැඩි ලෙස රඳා පවතින බවට සැකයක් නැත. මෙම නව සැලසුම තුළ සයිබර් ආරක්ෂාව අභියෝගයක් වනු ඇති අතර, එහිදී සියලු ජාතීන්ගේ සාමූහික ක්‍රියාමාර්ග අවශ්‍ය වනු ඇත.

- මෙම අර්බුදකාරී කාලසීමාව තුළ දී අපගේ ඩිජිටල් ප්‍රතිචාර පිළිබඳව අප ආඩම්බර වන අතර, වෙනත් බොහෝ රටවල් මෙන්ම, ඩිජිටල් තාක්ෂණයේ පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමේ දී ශ්‍රී ලංකාව ද සම්පත් හා පහසුකම්වලින් සීමා වී ඇත. අපගේ මිතුරන්ගේ විශිෂ්ඨ පරිචයන් සහ ජාතික යටිතල පහසුකම් සහ වෙනත් පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ඉගෙන ගැනීමට අපි යොමු වන්නේ මෙහිදීය.

- අද දින පැවති අපගේ සාකච්ඡා ඩිජිටල් බෙදීම් විසඳීම පිණිස තවදුරටත් සහයෝගීතාව සඳහා මංපෙත් විවර කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

ස්තූතියි.